## මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශය

# වෙළඳ ජාතික තනි කවුළු පද්ධති ව්‍යාපෘතිය (TNSWSP)

## රැකියා පුරප්පාඩු නිවේදනය - නීති හා නියාමන කටයුතු පිළිබඳ ජ්‍යෙෂ්ඨ නිලධාරී (තනතුරු 01)

දේශසීමා මායිම් ආශ්‍රිත වෙළඳ කටයුතු නියාමනය කිරීමේ නියෝජ්‍යායතන වෙත වෙළඳුන් විසින් දේශසීමා මායිම් හරහා සිදුවන සිය වෙළඳ ප්‍රවාහයන් (ආනයන, අපනයන හා ප්‍රතිනැව්ගත කිරීම්) පිළිබඳ ලේඛන හා දත්ත අවශ්‍යතා ඉදිරිපත් කිරීම සඳහා තනි ප්‍රවේශ කේන්ද්‍රයක් වශයෙන් වෙළඳ ජාතික තනි කවුළු පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් තීරණය කර තිබේ. එවැනි ක්‍රියාවලියක ප්‍රතිඵල ද අයදුම්කරුවන් වෙත ස්වයංක්‍රීය වෙළඳ ජාතික තනි කවුළුවක් හරහා දැන්විය යුතු ය.

ඒ අනුව, මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශය විසින් යෝජිත වෙළඳ ජාතික තනි කවුළු පද්ධති ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා එකී කාර්යය උදෙසාම වූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයක් (PIU) ස්ථාපනය කිරීමට තීරණය කර තිබේ. එබැවින්, වෙළඳ ජාතික තනි කවුළු පද්ධති ව්‍යාපෘතියේ යෝජිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයේ නීති හා නියාමන කටයුතු පිළිබඳ ජ්‍යෙෂ්ඨ නිලධාරී තනතුර සඳහා වඩාත්ම සුදුසුකම් සපුරා ලූ අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවීමට තීරණය කර තිබේ.

**සුදුසුකම්**

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන නීතිය පිළිබඳ මූලික උපාධිය; **හෝ**
- අදාළ ක්ෂේත්‍රය පිළිබඳ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක්;
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන නීතිය පිළිබඳ පශ්චාත් උපාධියක් වඩාත් පිළිගැනේ; **සහ**
- අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05ක පළපුරුද්ද; **සහ**
- ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වීම.

**පොදු කොන්දේසි**

- 2024.10.19 වන දිනට වයස අවුරුදු 63 නොඉක්මවිය යුතු ය.
- වාර්ෂික කාර්යසාධන ඇගයුම මත පදනම්ව වාර්ෂිකව කොන්ත්‍රාත්තුව දීර්ඝ කිරීමට යටත්ව, මාස 36ක කාල සීමාවක් සඳහා අයදුම්කරුවන් කොන්ත්‍රාත් පදනමින් බඳවා ගනු ලැබේ.
- 2024.10.19 වන දිනට හෝ ඊට පෙර අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරාලිය යුතුය.
- පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශයේ ලේකම් සතුය.
- මෙහි සඳහන් නොවන හෝ බඳවා ගැනීමේ ක්‍රියාවලිය තුළ පැන නගින යම් ගැටලුවක් සම්බන්ධයෙන් මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසන් හා එකම තීරණය වේ.
- වැටුප සම්බන්ධයෙන් සාකච්ඡා කර එකඟතාවයකට එළඹිය හැකි අතර, අනෙකුත් ප්‍රතිලාභ 2019 මාර්තු 05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 විධිවිධාන පරිදි හිමි වේ.

**අයදුම්කිරීමේ ක්‍රමවේදය**

අධ්‍යාපනික/ වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික, සේවා පළපුරුද්ද, සහ ජාතික හැඳුනුම්පතෙහි සහතික කළ පිටපත් සහ ඥාතීන් නොවන තමා පිළිබඳ විස්තර ලබාගත හැකි පුද්ගලයන් දෙදෙනෙකු සම්බන්ධ කරගත හැකි දුරකථන අංක සමගින් විස්තරාත්මක ජීව දත්ත පත්‍රිකාවක් සුදුසුකම් සපුරා ලූ අයදුම්කරුවන් විසින් 2024.10.19 වන දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපැල්/ අතින් ගෙනවිත් භාරදීම යන මාර්ග ඔස්සේ පහත ලිපිනයට ලැබෙන ලෙසට එවිය යුතු ය. අයදුම්පත සමග අනෙකුත් ලේඛන අන්තර්ගත ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඔබ විසින් අයදුම්කරන තනතුර සඳහන් කළ යුතු ය.

**ලිපිනය:**
**අධ්‍යක්ෂ ජනරාල්**
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන,
සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශය,
මහ ලේකම් කාර්යාලය, කොළඹ 01.

කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, ජීව දත්ත පත්‍රිකාව සමග අදාළ සියලු ලේඛන අසම්පූර්ණ ලෙස ඉදිරිපත් කිරීම නොසුදුසු වීම සඳහා හේතුවක් වනු ඇත.

තනතුරු පිළිබඳ කෙටි විස්තරයක් ද ඇතුළුව වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර මෙම වෙබ් අඩවිය වෙත පිවිසෙන්න. http://www.treasury.gov.lk

**ලේකම්**
මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන,
සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශය,
මහ ලේකම් කාර්යාලය, කොළඹ 01.
දිනය: 2024.10.06